සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

මගේ අංකය / My Number: ME/E/21(සබර/චක්‍රලේඛ)
ඔබේ අංකය / Your Number:
දිනය / Date: 2017/10/25

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක

**සබර/2017/09**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විෂයභාර අධ්‍යක්ෂවරුන්,
සියලුම ගණකාධිකාරීවරුන්,
අධ්‍යක්ෂ, පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය,
ස්ථානභාර නිලධාරී, මෙනේරිපිටිය/අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය.

## පුහුණු වැඩසටහන් /සම්මන්ත්‍රණ/ වැඩමුළු වලදී ගෙවීම් කිරීම් වලට අදාල කොන්දේසි හා නියමයන්

මෙම අමාත්‍යාංශ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාල පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පැවැත්වීම පිළිබඳව මා විසින් නිකුත් කර ඇති පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක සබර/2017/07 හා 2017.09.11 සහ සබර/2017/08 හා 2017.09.25 දිනැති චක්‍රලේඛ වලට අමතරව අදාල ගෙවීම් කටයුතු කිරීමේදී පහත සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූල වන පරිදි කටයුතු කළ යුතු බව ද අවධාරණය කරමි.

- ආහාර ද්‍රව්‍ය/ ලිපිද්‍රව්‍ය ඇතුළු සියලු මිලදී ගැනීම් වලදී පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 422.3 පරිදි කටයුතු කිරීම.

- වටිනාකම රු.50000.00 දක්වා මිලදී ගැනීම් වලදී අවම වශයෙන් මිල ගණන් 3ක් ලබා ගෙන මිලදී ගන්නා ආයතනය නිර්දේශ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබා ගැනීම.

- රු.50000.00 ඉක්මවන මිලදී ගැනීම් වලදී ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු වීම.

ගරු අමාත්‍යතුමා Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com

කාර්යාලය Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

- එක වැඩසටහනකට අදාලව එකම ද්‍රව්‍ය එකම දිනයේ ආයතන කීපයකින් මිලදී ගෙන ගෙවීම් සිදුකර ඇති බව නිරීක්ෂණය වී ඇති අතර එසේ නොකර කල් වේලා ඇතුව මිල ගණන් කැඳවා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය මිලදී ගැනීමට සැපයුම්කරු තෝරා ගත යුතු වීම.

- මිලදී ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් ලබා ගන්නා බිල්පත් ආයතනයේ නම හා ලිපිනය සඳහන් බිල්පත් වියයුතු වීම.

- සහභාගීවන්නන්, සම්පත්දායකයින් සහ කාර්ය මණ්ඩලයට හැර බාහිර පාර්ශවයන්ට ගෙවීම් කිරීමේදී හැකිතාක් දුරට චෙක්පත් මගින් ගෙවීමට කටයුතු කල යුතුවීම.

- පුහුණු වැඩසටහන් පවත්වා ඒ අදාළ වැයවන වියදම් පසුව ප්‍රතිපූර්ණය කිරීම සඳහා යොමු කිරීම හැකිතාක් දුරට අවම කිරීම.

- පුහුණු වැඩසටහන් වලට අදාළ සියලු වියදම් සම්බන්ධව වගකීම එම වැඩසටහන සංවිධානය කල නිලධාරියා විසින්ම දැරිය යුතුවීම.

- එක් අත්තිකාරමක් ලබාගෙන එය පියවන තෙක් ඊළඟ වැඩසටහන සඳහා අත්තිකාරම ලබා ගත නොහැකි බව.

මෙම චක්‍රලේඛය 2017 ඔක්තෝම්බර් 25 වන දින සිට වලංගුවේ.

මහින්ද එස් විරසූරිය
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

Ministry of Provincial Education
Sabaragamuwa

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

පිටපත්-

- ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - දැ.පි.
- පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - දැ.පි.
- සහකාර විගණකාධිපති, සබරගමුව පළාත - දැ.පි.
- අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ , සබරගමුව පළාත් සභාව - දැ.පි.
- විගණන අධිකාරී- රත්නපුර/කැගල්ල - දැ.පි.
- විෂය ගොනුවට - දැ.පි